9A

OL/2020/11/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**11 | S | I, II**

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
## கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
## General Certificate of Education (Ord. Level) Examination, 2020

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## බුද්ධ ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා** දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට **සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** බුදුරජාණන් වහන්සේ විසින් තමන් වහන්සේ දෙවියෙක්, ගාන්ධර්වයෙක්, යක්ෂයෙක්, මනුෂ්‍යයෙක් නොවන බවත් බුද්ධ නම් වන බවත් දේශනා කරනු ලැබුවේ,
(1) සොත්ථිය බමුණාට ය. (2) හුහුංක බමුණාට ය.
(3) ද්‍රෝණ බමුණාට ය. (4) භාරද්වාජ බමුණාට ය.

**2.** රජ්ජුමාලා, මට්ටකුණ්ඩලී වැනි අයට පිහිටවීම තුළින් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේගේ,
(1) පුරිසදම්මසාරථී ගුණයයි. (2) යථාවාදී තථාකාරී ගුණයයි.
(3) තාදී ගුණයයි. (4) අසරණ සරණ ගුණයයි.

**3.** ආර්ය මාර්ගයෙහි ගමන් කළ හෙයින් ද, සුන්දර වූ නිවනට සැපත් වූ හෙයින් ද, යහපත් වචන පවසන හෙයින් ද බුදුරජාණන් වහන්සේ,
(1) අරහං නම් වන සේක. (2) භගවා නම් වන සේක.
(3) සුගත නම් වන සේක. (4) ලෝකවිදූ නම් වන සේක.

**4.** බුදුරජාණන් වහන්සේ පළමු වස්කාලය ගතකළේ,
(1) බරණැස ඉසිපතන මිගදායේ ය. (2) විශාලා මහනුවර කූටාගාර ශාලාවේ ය.
(3) පාරිලෙය්‍ය වනයෙහි ය. (4) අජපාල නුගරුක මුල ය.

**5.** සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස ගණයට අයත් **නොවන්නේ** පහත කරුණු අතුරෙන් කුමක් ද?
(1) කීර්තිය පැතිරීම (2) ඕනෑම පිරිසක් වෙත නිර්භයව එළඹිය හැකිවීම
(3) සිහිමුලාවී කලුරිය කිරීම (4) මරණින් මතු සුගතියෙහි උපත ලැබීම

**6.** බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රයේ සූවිසි ගුණ ශිෂ්‍ය ජීවිතයක සාර්ථකත්වයට උපයෝගී කරගත හැක්කේ, එම ගුණ,
(1) ඉගෙනීමෙනි. (2) චරිතායනය කිරීමෙනි.
(3) සජ්ඣායනා කිරීමෙනි. (4) අන් අයට කියාදීමෙනි.

**7.** බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝසත් උතුමන් විසින් පුරනු ලබන උතුම් පිළිවෙත් සමූහය,
(1) දස කුසලකර්ම නම් වේ. (2) දස සිල් නම් වේ.
(3) දස පාරමිතා නම් වේ. (4) දස පුණ්‍යක්‍රියා නම් වේ.

[දෙවැනි පිටුව බලන්න.

9A



8. 'තෘෂ්ණා මාන මිථ්‍යා දෘෂ්ටියෙන් මිදී, කරුණා ප්‍රඥාවෙන් යුතුව ජීවිතය විනාශ වී ගියද සත්‍යගරුක වීම' ධර්මයේ හඳුන්වනු ලබන්නේ,
(1) සමතිස් පාරමී නමිනි. (2) සත්‍ය පාරමී නමිනි.
(3) සත්‍ය උප පාරමී නමිනි. (4) සත්‍ය පරමත්ථ පාරමී නමිනි.

9. අප මහ බෝසතාණන් වහන්සේ ප්‍රඥා පාරමිතාව පුරුණ කළ අවස්ථාවකට නිදසුනක් වන්නේ,
(1) වණ්ණුපථ ජාතකයයි. (2) උම්මග්ග ජාතකයයි.
(3) වට්ටක ජාතකයයි. (4) තේමිය ජාතකයයි.

10. "ගෞතමයන් වහන්ස, ඇතුළත අවුල් ය. පිටත අවුල් ය. සත්ත්ව ප්‍රජාව අවුලෙන් වෙළී සිටියි. කවරෙක් නම් මෙම අවුල් නිරවුල් කරන්නේ ද?" මෙම ප්‍රශ්නයට දුන් පිළිතුරෙහි ඇතුළත් ගැටලු විසඳීමේ ක්‍රමය වන්නේ,
(1) ත්‍රි ශික්ෂා වැඩීමයි. (2) ත්‍රි ලක්ෂණය වැඩීමයි.
(3) ත්‍රි විද්‍යා වැඩීමයි. (4) ත්‍රි වේදය වැඩීමයි.

11. ගිහියෙකු ලෞකික ජීවිතයක් ගත කිරීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපදා මාර්ගය ගෘහස්ථ සීලය නම් වන අතර එයින් ගිහියාගේ නිත්‍ය සීලය ලෙස හැඳින්වෙන්නේ,
(1) අෂ්ටාංග සීලයයි. (2) දස සීලයයි.
(3) ආජීව අෂ්ටමක සීලයයි. (4) පංච සීලයයි.

12. ලෝකයා, සත්ත්වයා යැයි කියනු ලබන ස්කන්ධ ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දැන කරනු ලබන භාවනාව හඳුන්වනුයේ,
(1) සමථ භාවනාව නමිනි. (2) විපස්සනා භාවනාව නමිනි.
(3) පිළිකුල් භාවනාව නමිනි. (4) ආනාපානසති භාවනාව නමිනි.

13. ත්‍රිවිධ රත්නයෙහි ගුණ නුවණින් දැන ඇතිකර ගන්නා පැහැදීම ධර්මයෙහි හැඳින්වෙන්නේ,
(1) අචල භක්තිය ලෙසයි. (2) අවෙච්චප්පසාදය ලෙසයි.
(3) සල්ලේඛ ප්‍රතිපදාව ලෙසයි. (4) අමූලිකා සද්ධා ලෙසයි.

14. බුද්ධාදී අටතැන්හි සැක කිරීම ධර්මයෙහි හැඳින්වෙන්නේ,
(1) කාමච්ඡන්ද නමිනි. (2) ව්‍යාපාද නමිනි. (3) ථීනමිද්ධ නමිනි. (4) විචිකිච්ඡා නමිනි.

15. දිගුකලක් නැවත නැවත කිරීමෙන් ප්‍රබලත්වයට පත්වන චේතනා පෙරටුකරගත් ක්‍රියා හෙවත් කුසලාකුසල කර්ම ධර්මයෙහි හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
(1) වේදනා (2) සඤ්ඤා (3) සංඛාර (4) විඤ්ඤාණ

16. 'රථය' යන සම්මුතිය විවිධ අංගෝපාංග එක් වී සෑදී ඇත්තාක් මෙන් 'සත්ත්වයා' යන සම්මුතිය ද විවිධ අංග එක්වීමෙන් සෑදී ඇත. ඒ අනුව සත්ත්වයා සැකසී ඇති අංග හඳුන්වන්නේ,
(1) පංචස්කන්ධය නමිනි. (2) පංච මහාභූත නමිනි.
(3) පංච ඉන්ද්‍රිය නමිනි. (4) පංච බල නමිනි.

17. තිදොරින් සිදු කරන අකුසල කර්ම අතර වචී කර්ම ගණයට අයත් **නොවන** අකුසලය කුමක් ද?
(1) පිසුනාවාචා (2) පරුසාවාචා (3) සම්ඵප්පලාපා (4) අභිධ්‍යා

18. සෞභාග්‍යමත් යහපත් කාලයක උපත ලද පුද්ගලයාට කාලය යහපත්වීම නිසාම වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව සැලසී පාප කර්මවල විපාක නොලැබී යයි. ධර්මයෙහි මෙය හැඳින්වෙන්නේ,
(1) ගති සම්පත්ති නමිනි. (2) උපධි සම්පත්ති නමිනි.
(3) කාල සම්පත්ති නමිනි. (4) ප්‍රයෝග සම්පත්ති නමිනි.

19. කර්මය හා කර්ම විපාකය පිළිබඳ බෞද්ධ විග්‍රහයට අනුව අන් සැපතට ඊර්ෂ්‍යා **නොකරන** තැනැත්තා,
(1) නිරෝගීව උපදී. (2) මහේශාක්‍යව උපදී.
(3) බුද්ධිමත්ව උපදී. (4) මහාභෝගීව උපදී.

20. "චතුරාර්ය සත්‍යය නොදැනීම හේතු කොටගෙන කුසලාකුසල කර්ම රැස් කරයි" යන්න සඳහන් අනුලෝම පටිච්ච සමුප්පාද පාඨය වන්නේ,
(1) "අවිජ්ජා පච්චයා සංඛාරා" යන්නයි. (2) "සංඛාර පච්චයා විඤ්ඤාණං" යන්නයි.
(3) "වේදනා පච්චයා තණ්හා" යන්නයි. (4) "උපාදාන පච්චයා භවෝ" යන්නයි.



NINE A | O/ L All Papers Download

9A



21. "වෛර කරන්නවුන් අතර අපි අවෛරීව සුවසේ වාසය කරමු" මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් පද දෙක කුමක් ද?
   (1) "තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති"
   (2) "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති"
   (3) "න හි වේරේන වේරානි - සම්මන්තීධ කුදාචනං"
   (4) "සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ"

22. ධාර්මිකව උපයා සපයාගත් ධනය ගිනි, සොර, සතුරු ආදීන්ගෙන් විනාශවීමට ඉඩ නොදී මනාව සුරක්ෂිත කරගැනීම හැඳින්වෙන්නේ,
   (1) උට්ඨාන සම්පදා නමිනි. (2) ආරක්ඛ සම්පදා නමිනි.
   (3) කල්‍යාණමිත්තතා නමිනි. (4) සමජීවිකතා නමිනි.

23. බුදුරජාණන් වහන්සේ විසින් අනුවණයින් ඇසුරු නොකිරීම, නුවණැත්තන් ඇසුරු කිරීම, පිදිය යුත්තන් පිදීම ආදී පුද්ගල දියුණුවට ඉවහල් වන කරුණු දේශනා කරනු ලැබුවේ,
   (1) දෙවියකුට ය. (2) බ්‍රාහ්මණයකුට ය.
   (3) ගෘහපතියකුට ය. (4) භික්ෂුවකට ය.

24. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි භාර්යාවගෙන් තම ස්වාමිපුරුෂයාට ඉටුවිය යුතු යුතුකම් අතරට අයත් **නොවන** කරුණ ඇතුළත් වරණය කුමක් ද?
   (1) ගෙදර කටයුතු මැනවින් සංවිධානය කිරීම
   (2) ඇසුරු කරන පිරිවර ජනයාට සංග්‍රහ කිරීම
   (3) උපයන ලද ධනය මනාව ආරක්ෂා කිරීම
   (4) ඇඳුම් පැළඳුම් සපයාදීම

25. ධනය හෙවත් භෝග සම්පත මනාව කළමනාකරණය කිරීමේ ඇති වටිනාකම අවධාරණය කරමින් අනේපිඬු සිටුතුමාට දේශනා කළ සූත්‍ර ධර්මය කුමක් ද?
   (1) පරාභව සූත්‍රය (2) ධම්මික සූත්‍රය (3) පත්තකම්ම සූත්‍රය (4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

26. "ස්වාමීනි අපි පස්කම් සැප අනුභව කරමින්, අඹුදරුවන් නිසා වන කරදර සහිතව ගිහිගෙයි වාසය කරමු. අපගේ මෙලොව හිතසුව පිණිස වන දහමක් දේශනා කරන සේක්වා" මෙම ඉල්ලීම කරනු ලැබුවේ,
   (1) කසීභාරද්වාජ බමුණා විසිනි. (2) දීඝජාණු කෝලිය පුත්‍රයා විසිනි.
   (3) සිගාල ගෘහපති පුත්‍රයා විසිනි. (4) අනේපිඬු සිටුතුමා විසිනි.

27. බුදුදහමට අනුව හට ගැනීමේ ස්වභාවය ඇති සෑම දෙයක්ම නැතිවීමේ ස්වභාවයෙන් ද යුක්ත වේ. මෙම සිද්ධාන්තය බුදුදහමේ පැහැදිලි කරන්නේ,
   (1) ලෝක ධර්ම ලෙස ය. (2) ලෝකෝත්තර ධර්ම ලෙස ය.
   (3) අනිත්‍ය ධර්ම ලෙස ය. (4) අවිජ්ජා ධර්ම ලෙස ය.

28. 'යම් බීජයක් වපුරා ඒ අනුව ඵල ලබයි. යහපත් ක්‍රියා තුළින් යහපත් විපාක ද ලබයි.' මෙම අදහස දැක්වෙන ගාථාවේ මුල් පද දෙක කුමක් ද?
   (1) "යාදිසං වපතේ බීජං - තාදිසං හරතේ ඵලං"
   (2) "යෙ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ"
   (3) "මනෝපුබ්බංගමා ධම්මා - මනෝ සෙට්ඨා මනෝමයා"
   (4) "සද්ධා බීජං තපෝ වුට්ඨි - පඤ්ඤා මෙ යුගනංගලං"

29. බෞද්ධ පංච බලි සංකල්පයේ එන 'අතිථි බලි' යන්නෙහි අර්ථය වන්නේ, උපයාගත් ධනයෙන්,
   (1) ඥාතීන්ට සංග්‍රහ කිරීමයි.
   (2) ආගන්තුකයින්ට සංග්‍රහ කිරීමයි.
   (3) මියගිය ඥාතීන්ට පින්දීමයි.
   (4) රජයට ගෙවිය යුතු බදු ගෙවීමයි.

30. "සත්ත්වයෝ කර්මය ස්වකීය කොට, දායාද කොට ඇත්තාහ. කර්මය නිසාම හීන බව, උසස් බව ඇති වේ." බුදුරජාණන් වහන්සේ මෙලෙස දේශනා කළේ,
   (1) ඡත්ත මානවකයාට ය. (2) සුභ මානවකයාට ය.
   (3) උග්ග සිටු පුත්‍රයාට ය. (4) සුදත්ත සිටුතුමාට ය.

[හතරවැනි පිටුව බලන්න.

NINE A | O/ L All Papers Download

**31.** දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන්ම දිගහැර අත්ල ඉදිරියට සිටින සේ නිරූපණය කෙරෙන මුද්‍රාව හඳුන්වන නම කුමක් ද?
(1) ධ්‍යාන මුද්‍රාව (2) අභය මුද්‍රාව (3) විතර්ක මුද්‍රාව (4) ධර්මචක්‍ර මුද්‍රාව

**32.** බෞද්ධ ධර්ම සන්නිවේදනයෙහිලා භාවිත ප්‍රධාන මාධ්‍යයක් වන චිත්‍ර කලාව යුග කිහිපයක් ඔස්සේ අනන්‍ය වූ ලක්ෂණ සහිතව සංවර්ධනය විය. එහිලා අනුරාධපුර යුගයට අයත් පැරණි සිතුවම් විද්‍යමාන වන ස්ථාන දෙකක් ඇතුළත් වරණය කුමක් ද?
(1) දිඹුලාගල හා මහියංගනය (2) මහියංගනය හා සීගිරිය
(3) හිඳගල හා දිඹුලාගල (4) සීගිරිය හා හිඳගල

**33.** මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා දක්වන පරිදි අනුරාධපුර යුගයට අයත් සඳකඩපහණින් සංකේතවත් කර ඇත්තේ,
(1) ආගමික සහජීවනයයි. (2) ආර්ය භාවයයි.
(3) භව චක්‍රයයි. (4) කෘෂි ජීවන ක්‍රමයයි.

**34.** ස්තූපයේ ආරක්ෂාවට ඉදිකළ පියස්සක් සහිත ගෘහය හඳුන්වන නම කුමක් ද?
(1) චෛත්‍යඝරය (2) පටිමාඝරය (3) බෝධිඝරය (4) පධානඝරය

**35.** සප්ත අපරිහානීය ධර්මවලට අයත් **නොවන** කරුණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) දිළින්දන්ට ධනය දීම
(2) කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම
(3) වැඩිහිටියන්ට හා ඔවුන්ගේ අදහස්වලට ගරු කිරීම
(4) තම රාජ්‍යයට පැමිණෙන පූජනීය උතුමන්ට පහසුකම් සැලසීම

**36.** කළ යුතු දේ නොකළ යුතු දේ තීරණය කිරීමේ දී පදනම් කර නොගත යුතු යැයි කරුණු දහයක් ගෙනහැර දක්වමින්, සිතීමට හා විමසීමට නිදහස ලබාදෙමින් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍ර ධර්මය කුමක් ද?
(1) අනත්ත ලක්ඛන සූත්‍රය (2) ආදිත්ත පරියාය සූත්‍රය
(3) කාලාම සූත්‍රය (4) වීමංසක සූත්‍රය

**37.** පාලකයකු තම රටවැසියාගේ යහපත සඳහා තම කාලය, ශ්‍රමය, ධනය සහ සුවපහසුව ආදිය කැප කිරීම දසරාජධර්මවල හැඳින්වෙන්නේ,
(1) දානය ලෙස ය. (2) සීලය ලෙස ය.
(3) පරිත්‍යාගය ලෙස ය. (4) අවිරෝධතාව ලෙස ය.

**38.** සූත්‍ර, විනය, අභිධර්ම යන ත්‍රිපිටකයට විභාෂා නම් අටුවා ග්‍රන්ථ සම්පාදනය කරනු ලැබුවේ,
(1) තෙවැනි ධර්ම සංගායනාවේ දී ය. (2) අලුවිහාර ධර්ම සංගායනාවේ දී ය.
(3) කණිෂ්ක ධර්ම සංගායනාවේ දී ය. (4) බුරුම ධර්ම සංගායනාවේ දී ය.

**39.** ධර්මාශෝක රජතුමා විසින් ක්‍රියාත්මක කරන ලද නවරට සසුන් පිහිටුවීමේ දී තෝරාගත් ප්‍රදේශය හා ඊට නායකත්වය දුන් තෙරුන් වහන්සේ නිවැරදිව සඳහන් වරණය තෝරන්න.
(1) කාශ්මීර ගන්ධාරය - මහාදේව හිමි
(2) අපරන්ත දේශය - රක්ඛිත හිමි
(3) හිමවන්ත ප්‍රදේශය - මජ්ඣිම හිමි
(4) මහිස මණ්ඩලය - මජ්ඣන්තික හිමි

**40.** "බුදුගුණ අනන්ත වන බැවින් නව ගුණ හැම කියත් නොපිළිවනිත් එහි පුරිසදම්ම සාරථී යන පදය ගෙණ ද ..." යනුවෙන් සඳහන් කරමින් බුදුගුණ වැයූ ග්‍රන්ථය රචනා කළේ,
(1) බුද්ධපුත්‍ර හිමි ය. (2) විද්‍යාචක්‍රවර්ති ය.
(3) ගුරුළුගෝමී ය. (4) ධර්මසේන හිමි ය.

* *

NINE A | O/ L All Papers Download

9A



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**11 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

## බුද්ධ ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) තුන්තරා බෝධිය නම් කරන්න.

(ii) "ගිලනුන්ට උපස්ථාන කරන්නා මට ද උපස්ථාන කරන්නේ ය." මෙම දේශනාවෙන් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවති කිනම් බුදුගුණය ද?

(iii) "කායේන සංවරෝ සාධු - සාධු වාචාය සංවරෝ" මෙම පාඨයේ අදහස ලියන්න.

(iv) අනේපිඬු සිටුතුමා සහ විශාඛා මහෝපාසිකාව සම්බුද්ධ ශාසනයට පූජා කළ ආරාම දෙක අනුපිළිවෙළින් ලියා දක්වන්න.

(v) සතර සංග්‍රහ වස්තු නම් කරන්න.

(vi) "මාගේ මේ ව්‍යායාමය රජ සැප පිණිස නොව සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම උදෙසා ය". මෙම ආදර්ශය ඉදිරිපත් කළ රාජ්‍ය පාලකයා කවු ද?

(vii) 'භෝග සුඛය' යන්නෙහි අර්ථය කුමක් ද?

(viii) "ඉමස්මිං අසති ඉදං න හෝති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති" මෙම පාඨයේ අදහස ලියන්න.

(ix) බුදුගුණ අලංකාරය හා පූජාවලිය යන ධර්ම ග්‍රන්ථ දෙක රචනා කළ ගත් කතුවරුන් අනුපිළිවෙළින් නම් කරන්න.

(x) බුදුරජාණන් වහන්සේගේ දකුණු අකුධාතුව තැන්පත් කොට දෙවනපෑතිස් රජතුමා ඉදිකළ ස්තූපය කුමක් ද?

**2.** (i) 'අනුසෝතගාමී' හා 'පටිසෝතගාමී' යන වචන දෙකෙහි අර්ථ දක්වන්න.

(ii) බුදු සිරිත පද්මාකාර ලෙස හඳුන්වන්නේ ඇයිදැයි පහදන්න.

(iii) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ ගෙනහැර දක්වන්න.

**3.** (i) 'සුකරානි අසාධූනි' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කොට ලියන්න.

(ii) එම ගාථාවේ තේරුම ලියන්න.

(iii) පුද්ගලයා වරදින් මුදවා සුචරිතයෙහි යෙදවීම සඳහා ධම්මපදයෙන් ලැබිය හැකි ආදර්ශ අගය කරන්න.

**4.** (i) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි උඩ දිසාවට උපමා කරනු ලැබුයේ කවුරුන් ද?

(ii) උඩ දිසාවට අයත් සමාජ කණ්ඩායම් විසින් ඉටු කළ යුතු යුතුකම් **තුනක්** ලියා දක්වන්න.

(iii) ආපදා අවස්ථාවක දී අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම අගය කරන්න.

**5.** (i) සිව්වන ථෙරවාද ධර්ම සංගායනාව (පුස්තකාරූඪ සංගායනාව) පැවැත් වූ ස්ථානය හා සහභාගි වූ භික්ෂූන් සංඛ්‍යාව ලියා දක්වන්න.

(ii) එම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු **තුනක්** ලියන්න.

(iii) ධර්ම විනයෙහි අනාගත සුරක්ෂිතතාව සඳහා මෙම සංගායනාවේ ප්‍රතිඵල හේතු වූ ආකාරය පැහැදිලි කරන්න.

9A



6. (i) ස්තූප ආකෘති හයෙන් දෙකක් නම් කරන්න.
   (ii) ස්තූපයක රූපසටහනක් ඇඳ එහි කොටස් තුනක් නම් කරන්න.
   (iii) ජාතික උරුමයන් සුරැකීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.
   (i) ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා
   (ii) සමජීවිකතා
   (iii) සතර අගතිය
   (iv) නෙක්ඛම්ම පාරමිතාව

* * *

9A

NINE A | O/ L All Papers Download

අ.පො.ස. (සා.පෙළ) විභාගය

# බුද්ධ ධර්මය

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 - 3 | 2 - 4 | 3 - 3 | 4 - 1 | 5 - 3 | 6 - 2 | 7 - 3 | 8 - 4 |
| 9 - 2 | 10 - 1 | 11 - 4 | 12 - 2 | 13 - 2 | 14 - 4 | 15 - 3 | 16 - 1 |
| 17 - 4 | 18 - 3 | 19 - 2 | 20 - 1 | 21 - 4 | 22 - 2 | 23 - 1 | 24 - 4 |
| 25 - 3 | 26 - 2 | 27 - 3 | 28 - 1 | 29 - 2 | 30 - 2 | 31 - 2 | 32 - 4 |
| 33 - 3 | 34 - 1 | 35 - 1 | 36 - 3 | 37 - 3 | 38 - 3 | 39 - 3 | 40 - 3 |

## II කොටස

(01) i. බුදු, පසේබුදු, මහරහත් / සම්මා සම්බුද්ධ, පච්චේකබුද්ධ, අරහන්ත බුද්ධ

ii. ගිලානෝපස්ථානය / ගිලනුන්ට උපස්ථානය කිරීමේ ගුණය

iii. කයෙන් සංවර වීම මැනවි / වචනයෙන් සංවර වීම මැනවි / කායික වාචික සංවරය යහපත්ය.

iv. ජේතවනාරාමය (දෙව්රම් වෙහෙර), පූර්වාරාමය (මිගාර මාතා ප්‍රාසාදය)

v. දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව.

vi. දුටුගැමුණු රජතුමා / දුට්ඨගාමිණී අභය රජතුමා / දුටුගැමුණු

vii. ධාර්මිකව උපයාගත් ධනය පරිභෝග කිරීමෙන් ලැබෙන සැපයයි.

viii. මෙය නැති කල්හි මෙය ඇති නොවේ - මෙය නැති වීමෙන් මෙය නැතිවේ.
මෙය නැති කල්හි මෙය නොවේ - මෙය නැති වී යාමෙන් මෙය නැතිව යයි

ix. බුදුගුණ අලංකාරය - වීදාගම මෛත්‍රිය හිමි / වීදාගම හිමි)
පූජාවලිය - බුද්ධ පුත්‍ර හිමි / මයුරපාද පිරිවෙන්පති

x. ථූපාරාමය (ලකුණු 20යි)

(02) i. * අනුසෝතගාමී යනු, ගඟ පහළට යන්නා සේ මිනිසා ද රාගාදී, ක්ලේශ ධර්මයන් කරාම යොමුවීමයි.

* පටිසෝතගාමී යනු බුදු දහමෙන් උඩුගම්බලා යන්නා සේ රාගාදී ක්ලේශ ධර්මයන්ගෙන් මිදීමට උත්සාහවන්ත වීමයි. (ලකුණු 02යි)

ii. නෙළුම් මල මඩ වතුරෙන් ඉහළට මතුවී එහි නොගෑවී සිටියි. අපිරිසිදු ජලය සහිත මඩ වතුරක හට ගන්නා නෙළුම් මල එය ඉක්මවා උඩට මතුවී විකසිත වී දසත සුවඳ විහිදුවයි. එම නෙළුම්මල් මෙන් බුද්ධාදී උතුමෝ කෙලෙස් මඩ වතුරෙන් ඉහළට නැඟී එහි නොගෑවී වැඩ වසති. එම නිසා බුදු සිරිතද පද්මාකාර ලෙස හඳුන්වනු ලැබේ. (ලකුණු 03)

iii. බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ බොහෝ ය.

- දුශ්චරිතයෙන් මිදී සුචරිතයට යාම.
- ශික්ෂාකාමී වීම.
- අටලෝ දහමින් කම්පා නොවීම.
- යහපත් ලෙස ශිෂ්‍ය පෞරුෂය ඇතිකර ගැනීමට හැකිවීම.
- සියලු ගැටුම් හමුවේ සාමකාමී බව ඇතිකර ගැනීමට හැකිවීම.
- සිසුන් අතර මෛත්‍රිය, කරුණාව, දයාව සහිතව ක්‍රියා කිරීමේ හැකියාව.
- සියලු දේ උපේක්ෂාවෙන් විඳ ගැනීමට හැකිවීම.

(මෙබඳු ආදර්ශ තුනක්වත් ඇති පිළිතුරකට සම්පූර්ණ ලකුණු 5යි)

(03) i. සුකරානි අසාධූනි - අත්තනෝ අත්තනෝ අහිතානිච
යං වේ හිතංච සාධුං ච - තං වේ පරම දුක්කරං (ලකුණු 02යි)

ii. තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසු ය. යම් දෙයක් තමාට වැඩදායක ද යහපත පිණිස හෝ පවතී ද එවැනි දේ කිරීම ඉතා අපහසු ය. (ලකුණු 03යි)

iii. ධම්ම පදයේ අඩංගු ගාථා මගින් අප ජීවිතය සකස්කරගත යුතු ආකාරය, කළයුතු දෙය, නොකළ යුතු දෙය මැනවින් පෙන්නා දෙයි. පුද්ගලයා වරදින් මුදවා සුචරිතයෙහි යෙදවීම සඳහා ධම්මපදය ආදර්ශ සපයයි. මිනිසා නිරන්තරයෙන් අයහපතට, පාපයට නැඹුරු වෙයි. යමෙකු කළ දේ සිතමින් වෛරය නැවත නැවත බඳී නම් ඔවුන්ගේ වෛරය නොසන්සිඳෙන බව උදාහරණයක් ලෙස දී ඇති "අක්කොච්ඡිමං අවධිමං ..." යන ධම්මපද ගාථාවෙන් පැහැදිලි වේ. ධම්මපද ගාථා දේශනා කොට තිබෙන්නේ විවිධ සිදුවීම් මුල්කොටගෙන ය. ඒවා නිදාන කථාව ලෙසින් හැඳින්වේ. පුද්ගලයා නිවැරදි යහපත් මාර්ගයට ගැනීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් ධම්ම පදයෙන් ලබා දේ. ඒවායේ සඳහන් උපමා, උදාහරණ, දේශය, කාලය හා පුද්ගල භේදයකින් තොරව ඕනෑම පුද්ගලයෙකුට අනුගමනය කොට යහපත සලසා ගැනීමට පුළුවන. ධම්මපදයේ භාෂාව සරලයි. සැම කෙනෙකුට ම හුරු පුරුදු උපමා උපමේයවලින් යුක්ත වේ. බුද්ධ වචනයේ සම්පිණ්ඩනය අන්තර්ගතවීමත්, පුද්ගල ජීවිතයේ විවිධ ගැටලු සහ ඒවාට විසඳුම් ඉදිරිපත් වීමත්, උත්සාහය, අධිෂ්ඨානය, ඉවසීම, කරුණාව, මෛත්‍රිය ආදී ගුණධර්ම පුද්ගල දියුණුව ඇතිකරන බවත් පෙන්වා දිය හැකිය. එහි සඳහන් වන උට්ඨානවතෝ සතිමතෝ ගාථාවෙන් ද පුද්ගලයාගේ දියුණුවට හේතුවන කරුණු පැහැදිළි වේ. මේවා පිළිපැදීමෙන් පුද්ගල ජීවිතය ආලෝකමත් කර ගැනීමට පුළුවන.

(04) i. පැවිදි උතුමන් / මහණ බමුණන් / ශ්‍රමණ / සමණ / බ්‍රාහ්මණෝ (ලකුණු 02යි)

ii. උඩ දිසාවට අයත් සමාජ කණ්ඩායම් විසින් ඉටු කළ යුතු යුතුකම්.

ගිහි පක්ෂය ඉටුකළ යුතු යුතුකම් පහකි.

- මෛත්‍රී සහගතව ක්‍රියා කිරීම.
- මෛත්‍රීසහගතව කතා කිරීම.
- මෛත්‍රී සහගත සිත් පහළ කිරීම.
- නිවසට පැමිණි විට සතුටින් පිළිගැනීම.
- ආමිසයෙන් සංග්‍රහ කිරීම.

පැවිදි පක්ෂය ඉටුකළ යුතු යුතුකම් හයයි.

- පවින් වැළැක්වීම.
- යහපත් ක්‍රියාවල යෙදවීම.
- හොඳ සිතින්ම අනුකම්පා කිරීම.
- නොඇසූ දේ කියා දීම.
- ඇසූ දේ වඩාත් පැහැදිළි කර දීම.
- සුගතියට මග පෙන්වීම.

(ලකුණු 03යි)

iii. ආපදා අවස්ථාවකදී අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටුකිරීම ඉතා වැදගත් වේ. වසංගත රෝග, සුළි සුළං, නාය යෑම්, සුනාමි, නියඟය වැනි ස්වභාවික හෝ මිනිස් ක්‍රියාකාරකම් මත සිදුවන ආපදා වැනි අවස්ථාවන්හිදී එකිනෙකාට අවශ්‍ය පරිදි සහයෝගය දීම අති උතුම් ක්‍රියාවකි. ආපදා අවස්ථාවන්හිදී එයට මුහුණ දෙන සහෝදර ජනතාවට ආහාරපාන, ඇඳුම්, පැළඳුම්, මුදල් ආධාර ආදී අත්‍යවශ්‍ය දේ ගෙන ගොස් සිත සතුටින් බෙදා දීම, ඔවුන්ගේ මානසික සුබ සිද්ධිය සඳහා අවශ්‍ය පරිදි සුදුසු ක්‍රියාකාරකම් සිදු කිරීම වැනි යහපත් උතුම් ක්‍රියාකාරකම් අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටු කිරීම ඉතා වැදගත් වේ.

පැවිදි පක්ෂය හා ගිහි පක්ෂය බැලීමේදී ආමිසයෙන් තමන්ට සංග්‍රහ කරන ගිහියාට පෙරළා ධර්ම දානයෙන් සංග්‍රහ කිරීම පැවිද්දාගේ යුතුකමකි. එනම් ගිහියා පවින් වැළැක්වීම, යහපතෙහි යෙදවීම, හොඳ සිතින් අනුකම්පා කිරීම, නොඇසූ දේ කියා දීම, ඇසූ දේ වඩාත් පැහැදිලි කිරීම හා සුගතියට මග පෙන්වීම යන අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටු කිරීම තුළින් මානසික ශක්තිය ගොඩනැගීම අන්‍යෝන්‍ය සුහදතාවය, සහජීවනය වැනි යහපත් සමාජ ධර්ම ගොඩනැගේ. වර්තමානයේ මුළු ලොවම මුහුණ දී ඇති කොරෝනා උවදුර වෙනුවෙන් මුළු ලොවම කෙරෙනා අන්‍යෝන්‍ය සුහදතාවය කොතෙක් වැදගත් වන්නේදැයි අපට පෙනේ. මේ අනුව ආපදා අවස්ථාවකදී අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම අගය කළ හැකියි.

(ලකුණු 5යි)

(05) i. පැවැත් වූ ස්ථානය - මාතලේ අලුවිහාරය / ආලෝක විහාරය / අලු ලෙන
සහභාගි වූ භික්ෂූන් සංඛ්‍යාව - භික්ෂූන් වහන්සේලා පන්සියනමක්.

(ලකුණු 02යි)

ii. තුඩුදුන් හේතු
- පිරිසිදු ථෙරවාදී බුදු දහම වෙනත් දූර්මතවලින් හානි වේ යැයි සිතා එය වළක්වා ගැනීම.
- බැමිණිතියා නම් සාගතය ඇතිවීම.
- සාගතයෙන් ඇති වූ අශේනිය නිසා දහම කට පාඩමින්ම පවත්වාගෙන යාම අනතුරුදායක බව වැටහීම.
- වළගම්බා රාජ්‍ය සමයේ ඇති වූ දකුණු ඉන්දීය ආක්‍රමණ.
- ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ අවශ්‍යතාවය ඇතිවීම.
- ලාංකේය භික්ෂූන් කණ්ඩායම් දෙකට බෙදී සිටීම.
- ධර්මය ඇසීම, ඉගෙනීම හා පර්යේෂණ කිරීමට ලේඛනගතව තිබීම වඩාත් වැදගත් බව සිතීම.

(ලකුණු 03යි)

iii.
- ත්‍රිපිටක ධර්මය වාචෝත්ගතව පවත්වාගෙන යාමෙන් එහි කිසියම් විකෘතිතාවක් ඇති වීමට තිබූ ඉඩකඩ මෙතුළින් මග හැරී යාම.
- භික්ෂූන් වහන්සේලා නිකායාන්තර වශයෙන් බෙදී විවිධ මතවාදයන්හි පිහිටා ධර්මය විවරණය කිරීම තුළින් ථෙරවාදී බුදු දහමට එල්ල වීමට තිබූ අභියෝග අවම වීම.
- පසුකාලීනව ථෙරවාදී බුදු දහම අභාවයට ගිය අවස්ථාවලදී නැවත එය ස්ථාපිත කිරීමට හැකිවීම තවත් වාසියකි.
- මෙම ථෙරවාදී බුදු දහම ලොව වෙනත් රටවල අභාවයට ගිය අවස්ථාවන්හිදී නැවත ස්ථාපිත කිරීමට ග්‍රන්ථාරූඪ කොට සුරක්ෂිතව පැවැති ලාංකික ධර්ම ග්‍රන්ථ උපකාරී වීම.
- බුදු දහම ස්ථාපිත නොවූ බටහිර රටවල බුදු දහම බෙදා හැරීමට ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කර තිබීම ප්‍රයෝජනවත් විය.
- ධර්ම විනය දෙකෙහි සුරක්ෂිතතාව මෙම සංගායනාව මඟින් සැලසුන නිසා මුඛ පරම්පරාගතව පුද්ගලයන් සතුව පවතිනවාට වඩා ස්ථාවරව, ලිඛිතව තිබීම නිසා එය සුරක්ෂිත කර ගැනීමට අවස්ථාව සැලසුණි.


(ලකුණු 05)

(06) i. ස්තූප ආකෘති හයෙන් දෙකක්.

1. ඝණ්ඨාකාර - සීනුවක හැඩය ඇති
2. ඝටාකාර - කළයක හැඩය ඇති
3. බුබ්බුලාකාර - දිය බුබුලක හැඩය ඇති
4. ධාන්‍යාකාර - ධාන්‍ය ගොඩක හැඩය ඇති
5. පද්මාකාර - පියුමක හෙවත් නෙළුම් මලක හැඩය ඇති
6. ආමලාකාර - නෙල්ලි ගෙඩියක හැඩය ඇති.

(ලකුණු 02යි)

ii.




(ලකුණු 03යි)

iii. බෞද්ධ ගෘහ නිර්මාණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම නිර්මාණය වනුයේ දාගැබ් වහන්සේ ය. දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන හෙළ සංස්කෘතියේ ප්‍රෞඪත්වය ලොවට හෙළිකරන ජාතික උරුමයන් රැසක් අප සතුව පවතී. ලොවක් මවිතයට පත් කරන විවිධ කලා නිර්මාණවලින් පොහොසත් මෙම පුණ්‍යභූමියේ පිහිටා පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම ලාංකික අප සැමගේ ම යුතුකමකි. එය අනාගත පරපුර වෙනුවෙන් සුරැකීම අපේ වගකීමයි. එය තනි පුද්ගලයෙකුට හෝ එක් ආයතනයකට පමණක් කළ හැකි කාර්යයක් නොවේ. ඇතැමුන් සිතා මතා කරනු ලබන ක්‍රියාකාරකම් නිසා අප සතු බෞද්ධ කලා ශිල්ප විනාශ වීමේ තර්ජනයකට මුහුණ පා තිබේ. මේවා ආරක්ෂා කර නොගතහොත් මතු පරපුරට අතීත උරුමයන් දැක ගැනීමේ අවස්ථාව අහිමිවනවා පමණක් නොව වසර දහස් ගණනක අපේ ප්‍රෞඪ ඉතිහාසය තහවුරු කරන ජීවමාන සාක්ෂිද අහිමිවේ. එම නිසා හැකි සෑම අවස්ථාවකම මේවා ආරක්ෂා කිරීමට යොමුවිය යුතු ය. පුරාවස්තු මංකොල්ලය, නිදන් හෑරීම, අන්තවාදී ක්‍රියා ආදිය නිසා රටක් ජාතියක් වශයෙන් අප උරුම කරගෙන තිබෙන ජාතික උරුමයන්ට හානියක් සිදු නොවීමට ඉඩ නාදී ආරක්ෂා කර ගැනීම අප සියලු දෙනාගේ වගකීමකි, යුතුකමකි.

(ලකුණු 05)

(07) i. **ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා :-**

ශතවර්ෂ තුනකට අධික කාලයක් තුළ ජාතික හා සංස්කෘතික නිදහස විදේශිකයන්ට යටත්ව පැවැති ඒ අඳුරු යුගයේ සිංහල බෞද්ධයා හට නිදහසක් ලබා ගැනීමට අවස්ථාව උදාකර දුන් උතුම් වීරවරයෙකි අනගාරික ධර්මපාල තුමා. රජයේ තනතුරු, තාන්න-මාන්න හිමිවූයේ කිතු දහම වැළඳගත් අයට පමණක් වූ අභාග්‍ය සම්පන්න යුගයක 1844 සැප්තැම්බර් 17 දින දොන් ඩේවිඩ් හේවාවිතාරණ නමින් මොහු ජන්ම ලාභය ලැබීය.

කුඩා කල සිට ම පන්සල ඇසුරු කරමින් බොදු ගුණ ධර්මයෙන් පෝෂණය වී හෙන්රි ඕල්කට්තුමා සමඟ එකතුව බුදු දහම නගාසිටුවීමට කටයුතු කළේය. බෞද්ධ දරුවන්ට මිෂනාරි අධ්‍යාපනය වෙනුවට බෞද්ධ අධ්‍යාපනයක් ලබා දීමට බෞද්ධ පාසල් ආරම්භ කළේය. බුදු දහම පිළිබඳ දේශන පවත්වමින් ''සිංහලයිනි නැගිටිවු - බුද්ධගයාව බේරා ගනිවු'' යනුවෙන් සිංහල බෞද්ධයා අවධි කරගෙන බුද්ධ ගයාව බේරා ගත්තේය. ගව ඝාතනයට හා ගව මස් කෑම, රහමෙර පානය ආදී පස් පව්වලට එරෙහිව ක්‍රියා කරමින් බොදු පිළිවෙත් ලෝකයට හඳුන්වා දුන්නේය.

එංගලන්තයේ ලන්ඩන් බෞද්ධ මධ්‍යස්ථානය, බරණැස මූලගන්ධ කුටි විහාරය, කල්කටාවේ ධර්මරාජික විහාරය, බුද්ධගයාවේ හා මදුරාසියේ බෞද්ධ විශ්‍රාමශාලා ආදිය ඉදි කළේය. විශාල ආගමික ශාසනික සේවාවක් ඉටු කරමින් අවසන් භාගයේ ''සිරි දේවමිත්ත ධර්මපාල'' යන නමින්

පැවිදි වී 1933 වර්ෂයේ උපසම්පදාව ලබා 1933 අප්‍රේල් මස 29 දින "සම්බුද්ධ සසුන බේරා ගැනීමට තවත් විසිපස් වතාවක් මේ දඹදිව ඉපදේවා! යන ප්‍රාර්ථනාව ඇතිව සිහිනුවණින් යුතුව අපවත් විය. සිංහල බෞද්ධයින් අවදි කරලීමට, දහම් අධ්‍යාපනය නගාසිටුවීමට මෙන් ම, සම්බුද්ධ ශාසනය පුබුදුවාලීමට ද මෙතුමාගෙන් අනුපමේය අතිවිශාල මෙහෙයක් ඉටු විය.

(ලකුණු 05)

ii. **සමජීවිකතා :-**

බුදුරජාණන් වහන්සේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේදී, සිඟාලෝවාද සූත්‍රයේදී, පත්තකම්ම සූත්‍රයේදී වැනි දේශනා රැසක් මගින් ධාර්මිකව ධනය උපයා ගත යුතු ආකාරය හා ඒවා සමසේ පරිහරණය කිරීම පිළිබඳ ව දේශනා කොට ඇත. බුදුරජාණන් වහන්සේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේදී දීඝජානු කෝලිය පුත්‍රයාට පුද්ගලයාගේ මෙලොව හිත සුව පිණිස දේශනා කළ කරුණු අතර සිව්වන කරුණ ලෙස සමජීවිකතාව හඳුන්වා දිය හැකිය. තමාගේ ආදායම හා වියදම පිළිබඳ මනා අවබෝධයෙන් යුතුව ආදායමට වඩා වියදම වැඩි නොකොට එය-වැය මනාව පැලනය කර ගැනීම සමජීවිකතාවයයි. උසස් ජීවන තත්ත්වයක් ළඟා කර ගැනීමට විශාල ධනයක් ඉපයීම අත්‍යවශ්‍ය නොවේ. ලැබෙන සුළු දේ වුවද පරිහරණයේදී පමණ දැන කටයුතු කළ යුතු ය. එසේ කිරීමෙන් පුද්ගලයෙකු හට මෙලොවදී ලද හැකි ඉහළ ම සැපය වන "අණන සුඛය" හෙවත් ණය නොවී සිටීමේ සැපය ලබා ගත හැකි ය. මෙවැනි පුද්ගලයින් තුළ අල්පේච්ඡතා ගුණය ද හොඳින් ඇති නිසා සුභරතාව හෙවත් පහසුවෙන් පෝෂණය කළ හැකිවීමේ ගුණය ද ඔහු සතුවන නිසා ඔහු අය-වැය හොඳින් හැඳින කටයුතු කිරීමට පෙළඹෙයි. අඩු ආදායමක් ලබා වැඩියෙන් වියදම් කිරීම තම පරිහානියට හේතු වේ. එසේ ම ඉහළ ආදායමක් ලබා ඉතා සුළුවෙන් වියදම් කරමින් ලෝභීව ජීවත් වීමද බුදු දහම අනුමත නොකරයි. මේ අනුව බුදු දහමට අනුව අය-වැය සමව දැන පරිහරණය කිරීම සමජීවිකතාවයයි.

ii. **සතර අගතිය :-**

නීතියට, යුක්තියට, ධර්මයට, සාධාරණත්වයට එරෙහි වී කටයුතු කිරීම අගතිගාමී වීමයි. රාජ්‍ය නායකයෙකු ගතියට පොළඹවන කරුණු හතරක් සතර අගතිය නමින් හඳුන්වයි. ඒවා නම්, ඡන්ද, ද්වේශ, භය, මෝහ නම් වේ. මෙම සතර අගතියට යන්නාගේ යසස අව පක්ෂයේ සඳ මෙන් පිරිහෙන බවද, අගතියට නොයන තැනැත්තාගේ යසස පුන් සඳ මෙන් වැඩෙන බවද බුදුරජාණන් වහන්සේ වදාළ සේක. එය රාජ්‍ය පාලකයකුට මෙන්ම අප හැමට අදාළ වන්නකි.

ඡන්දය යන්නෙන් අර්ථවත් වන්නේ කැමැත්තයි. තම නෑදෑකම, හිතවත්කම, පක්ෂපාතීත්වය, තමන්ගේ කම ආදී කරුණු පදනම් කරගෙන අගතයට යා හැක. නමුත් රාජ්‍ය පාලනයේදී පෞද්ගලික රුචි අරුචිකම් නොසලකා යුක්ති සහගතව කටයුතු කිරීමෙන් ඡන්දයෙන් අගතියට යාම වැළකේ.

ද්වේශය යනු විරුද්ධවාදීව ක්‍රියා කරන චෛතසිකයයි. තමන්ට පක්ෂපාතී නොවන අන්‍යයන්ට නීති විරෝධීව කටයුතුකම් කිරීම මෙහි ස්වභාවයයි. පාලකයා මධ්‍යස්ථව, යුක්තිග රුකව කටයුතු කිරීමෙන් මෙම ද්වේෂයෙන් මිදිය හැකි වේ.

භය යනු බිය වීමයි. තමා යටතේ වසන යම් පුද්ගලයන්ට අයුතු වරප්‍රසාද ලබා දුන්විට තමාට හිරිහැරවලට මුහුණපාන්නට සිදුවේ යයි සිතා හෝ තමාට පාඩුවක් අලාබයක් වේ යැයි සිතා පාලකයා බියෙන් වැරදි ක්‍රියාවලට පෙළඹේ. තමා සෘජුවම හෘද සාක්ෂියට එකඟව ක්‍රියා කරන්නේ නම් මෙම භය නමැති අගතියෙන් මිදිය හැකි වේ.

මෝහය යනු මුලාවයි. හොඳ-නරක, යුක්තිය-අයුක්තිය තෝරා බේරා ගැනීමේ ඇති නොහැකියාව නිසා තීක්ෂණ බුද්ධියෙන් තොරව තීරණ ගැනීම අගතිගාමී වීමයි.

බෞද්ධ ඉගැන්වීම වන්නේ පාලකයා සතර අගතියෙන් වැළකී යුක්තිසහගතව කරුණා මෛත්‍රීනේ නිර්භීතව ප්‍රඥාවන්තව ක්‍රියා කරන්නෙකු විය යුතුය. අගතිගාමී වන්නාගේ යසස පිරිහීමට පත්වේ. ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා සතර අගතියෙන් තොර වීම අවශ්‍ය බව බුදුරජාණන් වහන්සේ වදාරා ඇත.

(ලකුණු 05)



Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

ii. **නෙක්ඛම්ම පාරමිතාව :-**

පංච ඉන්ද්‍රියයන් පිනවීමට ඇති ආශාවෙන් ඉවත්වීමේ ප්‍රතිපදාව නෙක්ඛම්ම පාරමිතාවයි. බුද්ධ කාරක ධර්ම ලෙස හඳුන්වන දස පාරමිතා ධර්ම අතර තුන්වැන්න නෙක්ඛම්ම පාරමිතාවයි. තෘෂ්ණා මාන මිත්‍යා දෘෂ්ටීයෙන් මිදී ප්‍රඥා, කරුණාවෙන් යුතුව පංච කාම සම්පත්තියෙන් ඉවත් වීම නෙක්ඛම්ම පාරමිතාවේ මූලික අංගයයි. මෙය පුරන බෝසත් උතුමෝ ත්‍රිවිධ ආකාරයකින් එය පූරණය කරති. තම බාහිර වස්තු, අඹුදරුවන් අත්හැරීම නෙක්ඛම්ම පාරමිතාවයි. ශරීරාවයන් නැති වුවත් කාමයන්ගෙන් වෙන් වී සිටීම නෙක්ඛම්ම උප පාරමිතාවයි. ජීවිතයට හානියක් වුවද කම් සැප නොවිඳීම නෙක්ඛම්ම පරමත්ථ පාරමිතාවයි. අප මහ බෝසතාණන් වහන්සේ නෙක්ඛම්ම පාරමිතාව පූරණය කළ ආකාරය මඛාදේව ජාතකයෙන් පැහැදිලි වේ. අසීමිත ආශාවන්ගෙන් යුක්තවීමට හේතු වන්නේ මහිච්ඡතාවය නිසාය. අඩු බලාපොරොත්තු ඇති බව යන අල්පේච්ඡතාවය ඉතා ප්‍රයෝජනවත් ය. මැදහත්ව කටයුතු කිරීමේ පුහුණුවක් නෙක්ඛම්ම පාරමිතාව තුළින් අප ජීවිතයට එක්කර ගත හැකි ය. සැහැල්ලු මනසකින් යුතු ව සෞඛ්‍ය සම්පන්නව හා සදාචාරාත්මකව දෛනික කටයුතු සිදු කිරීමට මෙම ගුණධර්මය ප්‍රගුණ කළ හැකි ය.

(ලකුණු 05)



Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!